## ශ්‍රී ලංකා හදබිම අධිකාරිය - 2017

-----------------------------------------------------------

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම නීතිගත සංස්ථා පනතේ 23 වගන්තියට 2017 ජුලි 07 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 2026/45 මගින් සිදු කරන ලද සංශෝධනයන් සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2018 මැයි 17 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ (හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරියේ) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 76 (ඇ) හා 80 (ඇ) ප්‍රකාරව, වාර්තාකරණ දිනයෙන් පසුව මාස 12 ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂිත වත්කම් හෝ නිරවුල් කිරීමට නියමිත වගකීම් පමණක් ජංගම වත්කම් හා වගකීම් ලෙස හඳුනා ගත යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.23,535,616 ක සේවක ණය ජංගම හා ජංගම නොවන ලෙස වර්ගකර දක්වා නොතිබූ අතර මාස 12 ක් ඇතුළත උපලබ්ධි වන රු.1,397,363 ක පාරිතෝෂික වෙන්කිරීම් ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ක්ෂය ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය වෙනස්කර තිබූ අතර ඒ අනුව වූ බලපෑම අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම කල යුතුය. එහෙත් අධිකාරිය විසින් 2017 ජනවාරි 01 දිනට පැවති වත්කම්වලින් කොටසක් සඳහා පමණක් ගිණුම් ප්‍රතිපත්ති වෙනස්කිරීම තුලින් වූ බලපෑම අතීතානුයෝගීව ගිණුම්ගත කර තිබූ අතර රු.10,851,120 ක් වටිනා වත්කම්වලට අදාල ක්ෂය සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපල පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කල යුතුය. එහෙත් අධිකාරිය සතු වාහන ප්රත්‍යාගනනය කිරීමේදී පිරිවැය රු.1,462,100 ක් වූ වාහන 3ක් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 සහ 2015 වර්ෂවලදී අලෙවි අංශයේ සිදුවූ මුදල් වංචාවක් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් තවදුරටත් අයකරගත යුතු මුදල රු.1,121,740 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.1,899,508 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ යතුරු පැදි වෙනුවෙන් 2017 වර්ෂය සඳහා තවදුරටත් රු.215,544 ක් ක්ෂය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය එම වටිනාකමින් වැඩියෙන් හා දේපල පිරියත හා උපකරණවල ශුද්ධ අගය සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.13,441,694 ක් වුවද එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.13,723,193 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම රු.281,499 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ප්‍රාග්ධන ප්‍රදාන මගින් මිලදී ගෙන තිබුණු ශුද්ධ අගය රු.36,860 ක් වූ වත්කම් සමාලෝචිත වර්ෂයේ අලෙවි කර තිබුණ ද එම වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අධිකාරියේ ජංගම ගිණුමකට අදාල අවසන් වරට පිළියෙල කර තිබූ 2017 ඔක්තෝබර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබූ සෘජු බැර රු.11,500 ක් හා සෘජු හර රු.8,000 ක් වුවද එම ශේෂ හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ගිණුම්වල අලෙවි අංශයට ගෙවිය යුතු ණය ලෙස රු.9,272,946 ක් දක්වා තිබුණද අලෙවි අංශයේ ලැබිය යුතු ශේෂ යටතේ රු.9,609,773 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.336,827 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව හදබිම අධිකාරියෙන් ලැබිය යුතු ලෙස රු.54,912,000 ක් දක්වා තිබුණද හදබිම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ශේෂයක් නොතිබූ අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ලැබිය යුතු ශේෂය රු.2,094,280 ක් ලෙස දක්වා තිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සංචිත ශේෂය වූ රු.64,947,902 ක් තුළ 1978 වසරේ සිට අඛණ්ඩව පැවත එන ගිණුම් 3 කට අදාළව රු.2,081,413 ක ශේෂයක් පැවති අතර එම සංචිත පවත්වාගෙන යාමේ අරමුණු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ සිට ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.50,998 ක කාර්ය මණ්ඩල ණය ගැලපුම් ගිණුමේ ශේෂය 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.41,864,292 ක් වූ අතර ඒ තුළ ඇතුළත් වසර 1 සිට වසර 10 දක්වා කාල පරාසයකට අයත් රු.169,838 ක් වූ ලැබිය යුතු ශේෂ 39 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවයෙන් ඉවත් වී තිබූ නිලධාරීන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.367,581 ක් හා වැඩ තහනම් කරන ලද හා සේවය හැර ගිය සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.111,047 ක ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 6 ඉක්ම වූ රු.2,328,439 ක් වටිනා චෙක්පත් 307 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

------------------------------------------------------------------

2011 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ඩීඑම්එස්/ඊඅයි/14/05/115(VOL1) දරන ලිපියට අනුව කාර්යක්ෂමතා දීමනා ගෙවීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කර නැවත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත් ඒ අනුව කටයුතු කිරීමකින් තොරව 2017 වර්ෂය සඳහා කාර්යක්ෂමතා දීමනා ලෙස රු.397,006 ක් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.684,322 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,359,802 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.675,480 ක පිරිහීමක් විය. අලෙවි අංශයේ අතිරික්තය රු.1,527,490කින් අඩුවී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.23,704,832 ක් වූ අතිරික්තය 2015 වර්ෂය අවසානයට රු.798,107 දක්වා අඛණ්ඩව අඩුවී තිබුණි. එහෙත් 2016 වර්ෂයේදී රු.1,359,801 ක් දක්වා නැවත වැඩිවී තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දී රු.684,322 දක්වා නැවත අඩු වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.67,807,816ක් වූ දායකත්වය උච්ඡාවචනය වී තිබූ නමුත් 2017 වර්ෂය අවසානයට රු.73,010,089 ක් දක්වා වැඩි වී තිබුණි.

**3.2 අධිකාරියට එරෙහිව සහ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

---

ආයතනයේ සේවයේ නියුතුව සිටි සේවකයින් 04 දෙනෙකු විසින් සේවය අවසන් කිරීම මත අධිකාරියට එරෙහිව අධිකරණයේ නඩු 04 ක් පවරා තිබුණු අතර අලෙවි අංශයේ මුදල් වංචාවක් සම්බන්ධයෙන් රු.1,696,740 ක මුදලක් අයකර ගැනීම සඳහා අධිකාරිය විසින් හිටපු සේවකයෙකුට එරෙහිව අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1 කාර්යසාධනය**

---

**4.1.1 සැලසුම් කිරීම**

---

**ක්‍රියාකාරී සැලැස්ම**

---

සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව ඇතුලත් කල යුතු සංරචක හා අලවි අංශයට අදාල ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

**4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම නීතිගත සංස්ථා පනත අනුව, අධිකාරිය වෙත ප්‍රධාන කාර්යයන් 05 ක් පැවරී තිබුණ ද 2017 වර්ෂය තුල සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.55,600,000 ක් වැයකර පාංශු සංරක්ෂණ කටයුතු හා දියබෙත්ම කළමනාකරණය සම්බන්ධ කටයුතු පමණක් සිදුකර තිබුණු අතර කෘෂිකාර්මික විවිධාංගීකරණය, කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම හා අලෙවි කිරීම, කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස සංවර්ධනය සඳහා පිරියත, උපකරණ සහ යන්ත්‍රෝපකරණ පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

(ආ) අලෙවි ව්‍යාපෘතිය

---

වස විසෙන් තොර කෘෂි නිෂ්පාදන ඉහල නැංවීම හා ග්‍රාමීය කෘෂි නිෂ්පාදන සඳහා ගොවියාට ඉහළ මිලක් ලබාදීම අරමුණු කරගෙන අලෙවි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද අලෙවි කරන කෘෂි නිෂ්පාදන වසවිසෙන් තොර බවට පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණ අතර ග්‍රාමීය කෘෂි නිෂ්පාදන මිලට වඩා වැඩි මිලකට මධ්‍යම වෙළඳපොලෙන් කෘෂි නිෂ්පාදන මිලට ගෙන තිබුණි.

(ඇ) අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති 03ක ක්‍රියාකාරකම් 05 ක් සම්බන්ධයෙන් ළඟාකර නොගත් මූල්‍ය ප්‍රගතිය සියයට 24 සිට සියයට 75 දක්වා පරාසයක පැවතුණි.

(ඇ) 2017 වාර්ෂික ක්‍රියාකරී සැලැස්ම සංශෝධනය කර වෙනත් ව්‍යාපෘති දෙකකට වෙන්කරන ලද රු.27,500,000 ක මුදලක් ගොවිපළින් බැහැර පාංශු සංරක්ෂණ හා ආපදා ජල කළමනාකරණය සඳහා වූ ව්‍යාපෘතියට මාරු කර තිබුණද එම ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.5,600,000 ක් හෙවත් සියයට 20 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කොත්මලේ හා පල්ලේකැලේ ගොවිපළවල් දෙකෙහි අලාභය රු.1,166,612 ක් වී තිබූ අතර 2015 මාර්තු 04 දිනැති අංක 07/04/04 දරන වාරි මාර්ග හා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මගින් එම ගොවිපළ 02 සඳහා නිෂ්පාදනය හා ආදායම් නිශ්චිතව හඳුනාගත් මාසික අනුබෙදීම් සහිත ව්‍යාපාරික සැලැස්මක් සකස් කර ගොවිපළවල් ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනීමට කටයුතු කරන ලෙස දක්වා තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 ප්‍රකාරව සුභසාධන යෝජනා ක්‍රම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. එහෙත් අධිකාරිය විසින් පිහිටුවා තිබූ අවදානම් සංචිත අරමුදල සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබූ අතර වැඩ කරන දිනක් සඳහා රු.250 බැගින් වෙන්කර 2011 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා එම අරමුදල සඳහා රු.613,581 ක් බැර කර තිබුණි. තවද, එම අරමුදලින් සිදුකරන ගෙවීම් සම්බන්ධයෙන් ක්‍රමවේදයක් හා නිර්නායකයක්ද සකස් කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අලෙවි ව්‍යාපෘතියේ කාර්ය සාධනය පරීක්ෂාවේදී 2016 වර්ෂය හා සැසඳීමේදී 2017 වර්ෂයේදී එළවළු විකුණුම් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 15681 කින් ද පලතුරු විකුණුම් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 12178 කින් ද පොල් අලෙවිය ගෙඩි 19035 කින්ද අඩුවී තිබුණු අතර කුකුල් මස් අලෙවියක් සිදු කර නොතිබුණි. තවද ප්‍රධානම අලෙවි ද්‍රව්‍ය වර්ගීකරණයන් 06 කම විකුණුම් ප්‍රමාණය සියයට 09 සිට සියයට 44 දක්වා පරාසයකින් අඩුවී තිබුණි.

(ආ) 2017 වර්ෂයට අදාලව සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් පාංශු සංරක්ෂණ ආදර්ශන නඩත්තුව සම්බන්ධයෙන් අදාළ ආයතනවලට වගකීම පවරා නොතිබුණු අතර ඒකක කළමනාකරුවන් / කලාප කළමනාකරුවන් විසින් ඒ පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------------

2005 වර්ෂයේ දී රු.346,225 ක වියදමින් පල්ලේකැලේ ගොවිපළෙහි ඉදිකර තිබූ ස්ථිර ගොඩනැගිල්ලක් සහ අලෙවිසැල් ගොඩනැගිල්ල ද, 2011 වර්ෂයේ දී රු.535,100 ක් වැයකර කොත්මලේ ගොවිපළෙහි ඉදිකර තිබූ පුහුණු මධ්‍යස්ථානය සහ ගොවිපළේ ඇති පැරණි අශ්වගාලට අයත් භූමිය දීර්ඝ කාලයක සිට කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි.

## 4.5 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

-----------------------------------------------------------------------------------------

අධිකාරිය විසින් පවරා නොගත් ඉඩමක 2014 වර්ෂයේදී රු.5,999,835 ක් වැය කර අලෙවිසැලක් ඉදිකර තිබූ අතර 2018 මැයි මාසය වන විටත් එම ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හදබිම අධිකාරිය හා අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ 2017 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් තනතුරු 11ක් සඳහා පුරප්පාඩු 15 ක් ද අලෙවි ව්‍යාපෘතියේ තනතුරු 04 ක් සඳහා පුරප්පාඩු 07 ක්ද පැවති නමුත් එම පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, අධිකාරියට අයත් ගොවිපළ දෙකෙහි කටයුතු සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් අනුමත කර නොගෙන හදබිම අධිකාරියට අනුමත වූ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගෙන් ගොවිපළේ කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) ඉහළ කළමනාකාරිත්වයේ තනතුරු 02 ක් වෙනුවෙන් 2005 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 13 ක් ද්විතීයන පදනම යටතේ නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර තිබුණු අතර, එම තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කාර්ය මණ්ඩලයේ පුහුණුවීම් සඳහා පසුගිය වර්ෂ 05 ක් තුළ වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 30 ක් ඌන උපයෝජිතව පැවති අතර, 2017 වර්ෂය තුළදී අධිකාරියේ සේවකයින් 03 දෙනෙකු සහ අලෙවි අංශයේ සේවකයින් 27 දෙනෙකු පැය 08 ට වඩා අඩු පුහුණු පැය සංඛ්‍යාවක් ආවරණය කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 71(i) (අ) ප්‍රකාරව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ පූර්ව අධිකාරි බලය ලබා ගැනීමෙන් තොරව අලෙවි ව්‍යාපෘතිය යටතේ අනුමත අලෙවි සහායක තනතුර බිල්පත් එකතු කරන්නා ලෙස වෙනස් කර තිබුණු අතර නිලධාරීන් 21 දෙනෙකු ඒ සඳහා බඳවාගෙන තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

-----------------------------

2017 අගෝස්තු 14 දිනැති එස්පී/එස්පී/එස්පීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආරක්ෂක කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------------

## 6.1 අභ්‍යන්තර විගණනය

-----------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(i) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කර නොතිබුණි. තවද අභ්‍යන්තර විගණන කටයුතු සඳහා එක් නිලධාරියකු පමණක් අනුයුක්ත කර තිබූ අතර චක්‍රලේඛය ප්‍රකාරව සිදුකල යුතු පද්ධති විශ්ලේෂණය, කාර්යසාධන විශ්ලේෂණය සහ විශේෂ විමර්ෂනය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

## 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------------

### 6.2.1 ප්‍රසම්පාදනයන්

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව අලෙවිසැලේ භාවිතා කිරීම සඳහා පිරිවැය රු.504,033 ක බැග් මිලදී ගෙන තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද අධිකාරිය විසින් එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාලව රු.30,399,000 ක් වටිනා ප්‍රසම්පාදනයන් සැලසුම් කර තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි.

## 6.3 අයවැය පාලනය

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 5.2.1 ඡේදය අනුව අයවැය ඇස්තමේන්තුව සමග අයවැය ගත ශේෂ පත්‍රය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අයවැය ගත ප්‍රාග්ධන වියදම් වාර්තාවක් සමග ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භවීමට පෙර දින 15 කට පෙර අනුමත අයවැය වාර්තාව භාණ්ඩාගාරයට හා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

----------------------------------------

2006 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ප්‍රකාරව වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී 150 ක් ඇතුලත පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත් 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2018 ජූනි වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

-----------------------------------

2004 වර්ෂයට පෙර සිට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අයවිය යුතු රු.2,094,280 ක් සම්බන්ධයෙන් 2010 පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී අවධානය යොමුකර විසඳීමට නියම කර තිබුණද 2018 මැයි 30 දින වන විටත් එය විසඳීමට කටයුතු කර නොතිබුණි.

## 6.6 පාරිසරික වගකීම්

----------------------------

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ආදර්ශ පාඨය "සුරකිමු මිහිමඩල" වුවද අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන අලෙවිසැලේ අපද්‍රව්‍ය දිරන හා නොදිරන ලෙස වෙන් කිරීමකින් තොරව කොත්මලේ ගොවිපල වෙත මුදාහැර තිබූ අතර ඒ අනුව පාරිසරික ගැටළු මතුවිය හැකි බව නිරීක්ෂණය විය.

**7. පද්ධති හා පාලනයන්**

-----------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ඇතැම් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම. |
| (ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් පාලනය | වර්ෂ ගණනාවක සිට පැවත එන ණය ශේෂ පියවීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත නොවූ තනතුරු සඳහා බඳවා ගැනීම හා පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබිම. |
| (ඈ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන සැලැස්මකට අනුකූලව කටයුතු කර නොතිබීම. |
| (ඉ) ප්‍රසම්පාදන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලින් බැහැරව කටයුතු කර තිබීම. |
| (ඊ) වත්කම් පාලනය | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ග නොගැනීම. |